ET/SSS/2022(2023)/OL/50/S/A/S-4

අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி அமைச்சு
Ministry of Education

G. C. E. Ordinary Level | අ. පො. ස. සාමාන්‍ය පෙළ | 2022 (2023)

# Student Seminar Series

## ශිෂ්‍ය සම්මන්ත්‍රණ මාලාව

Practice Paper | උපකාරක ප්‍රශ්න පත්‍ර

# Drama & Theatre

# නාට්‍ය හා රංග කලාව



**Answer Sheet - I, II | පිළිතුරු පත්‍රය - I, II (සිංහල මාධ්‍යය)**

Nenasa

The National e-learning Portal for The General Education

මෙහෙයවීම : දුරස්ථ අධ්‍යාපන ප්‍රවර්ධන ශාඛාව | අන්තර්ගතය : සෞන්දර්යය අධ්‍යාපන ශාඛාව

# අ.පො.ස.(සා/පෙළ) පෙරහුරු ප්‍රශ්න පත්‍ර - 2022 - 04

## 50 - නාට්‍ය හා රංගකලාව

## ලකුණු බෙදීයාම

I පත්‍රය

ලකුණු 1 ×40 = 40 කි.

II පත්‍රය

II පත්‍රය ප්‍රශ්න 07 කි. 01 වන ප්‍රශ්නය අනිවාර්ය ප්‍රශ්නයකි. ඉතිරි ප්‍රශ්න 06 යෙන් 04 ක් තෝරා ගෙන පිළිතුරු සැපයිය යුතු ය.

01 ප්‍රශ්නයට ලකුණු 12 කි.

- ❖ තෝරාගන්නා ඉතිරි ප්‍රශ්න 04 කට ලකුණු 12 × 04 = 48කි.

02 ප්‍රශ්නයට ලකුණු 12 කි.
03 ප්‍රශ්නයට ලකුණු 12 කි.
04 ප්‍රශ්නයට ලකුණු 12 කි.
05 ප්‍රශ්නයට ලකුණු 12 කි.
06 ප්‍රශ්නයට ලකුණු 12 කි.
07 ප්‍රශ්නයට ලකුණු 12 කි.

} ඕනෑ ම ප්‍රශ්න 04 ට ලකුණු 48 කි.

| | |
|---|---|
| I පත්‍රයට ලකුණු | 40 |
| II පත්‍රයට ලකුණු | 60 |
| මුළු ලකුණු | 100 |

**විෂය අංකය - 50** **විෂයය - නාට්‍ය හා රංග කලාව**

**අ.පො.ස (සා/පෙළ) පෙරහුරු ප්‍රශ්න පත්‍ර - 04**

**I පත්‍රය - පිළිතුරු**

| ප්‍රශ්න අංකය | පිළිතුරෙහි අංකය | ප්‍රශ්න අංකය | පිළිතුරෙහි අංකය | ප්‍රශ්න අංකය | පිළිතුරෙහි අංකය | ප්‍රශ්න අංකය | පිළිතුරෙහි අංකය |
|---|---|---|---|---|---|---|---|
| 01. | **04** | 11. | **04** | 21. | **02** | 31. | **01** |
| 02. | **01** | 12. | **02** | 22. | **03** | 32. | **04** |
| 03. | **04** | 13. | **02** | 23. | **01** | 33. | **01** |
| 04. | **03** | 14. | **01** | 24. | **03** | 34. | **03** |
| 05. | **02** | 15. | **04** | 25. | **04** | 35. | **02** |
| 06. | **03** | 16. | **03** | 26. | **03** | 36. | **01** |
| 07. | **01** | 17. | **04** | 27. | **02** | 37. | **02** |
| 08. | **02** | 18. | **03** | 28. | **04** | 38. | **03** |
| 09. | **01** | 19. | **01** | 29. | **01** | 39. | **04** |
| 10. | **04** | 20. | **02** | 30. | **03** | 40. | **04** |

**විෂය අංකය - 50** **විෂයය - නාට්‍ය හා රංග කලාව**

**අ.පො.ස (සා/පෙළ) පෙරහුරු ප්‍රශ්න පත්‍ර - 04**

**II පත්‍රය - පිළිතුරු**

01.

I. නිල්මිණී සිගේරා. (ලකුණු 02 )

II. ප්‍රියංගනීට දරා ගැනීමට නොහැකි සහ ඇයට රුචි නොවන අධ්‍යාපන මාවතකට දෙමාපියන්ගේ බලපෑම මත ඇයට යොමු වීමට සිදු වීමයි. (ලකුණු 02 )

III. හිල්ඩා සහ ප්‍රියංගනී අතර, හිල්ඩා සහ කරුණාරත්න අතර, ජගත් සහ ඔහුගේ දෙමාපියන් අතර, පවුල සහ සමාජය අතර. (ලකුණු 02)

IV. "ටියුෂන්... ටියුෂන්... ටියුෂන් බයෝ" ගීතය රංගනය කරන අවස්ථාව.

නාට්‍යය ආරම්භයේ දී තාරුණ්‍ය සංකේතවත් කිරීම සඳහා දෙවොල් බෙරය භාවිත කිරීම.

(ලකුණු 02)

V. කෙටි දර්ශන රැසක් දැකිය හැකි වීම, සංවාද සහ අවස්ථා නිරූපණවල නාට්‍යෝචිත බව දුර්වල වීම, නාට්‍ය සන්දර්භයට නොගැළපෙන අයුරින් ශාස්ත්‍රකරු/වියුෂන් පොළ වැනි ඒවා ඉදිරිපත් කිරීම, කේන්ද්‍රීය පුවතට එතරම් අදාළ නොමැති නිරූපණ පැවතීම, අවුරුදු හතකට පසු දහවන දර්ශනය ඉදිරිපත් වීම, ස්වාභාවික සංවාද සහ ක්‍රියා නිරූපණ අවස්ථාවන් එකවර ම නර්තන හා සංගීතමය නිරූපණ බවට පත් වීම (ලකුණු 02 )

VI. සරණපාලගේ කතාව, ජගත්ගේ කතාව (ලකුණු 02 )

02. (I) මලය රජු, පඬුවස්දෙව් රජු, විජය රජු. (ලකුණු 02 )

(ii) ඌරා යක්කම, නයා යක්කම, වැදි යක්කම, සීතා යක්කම, දර්පණ යක්කම. (ලකුණු 04)

(iii) ඉහත යක්කම්වලින් දෙකක් විස්තර කොට ඇත්නම් සම්පූර්ණ ලකුණු ලබා දෙන්න.

(ලකුණු 06)

03. (I) රංගයට වඩාත් උචිත ලෙස/ නාට්‍යයට වඩාත් උචිත ලෙස යොදා ගනු ලැබූ සංගීතය.

(ලකුණු 02 )

(ii) ටොනික් පියන්, ලී පෙට්ටි, සිලි බෑග්, එක්ස්රේ කාඩ්, පොල් කටු, උණ බට, බැරල්, බූලි, ලී පටි, කළ ගෙඩි, බෝතල් ආදී කරුණු හතරක් දක්වා ඇත් නම් ලකුණු ලබා දෙන්න. (ලකුණු 04 )

(iii)
- නාට්‍ය පිටපත හොඳින් අධ්‍යයනය කිරීම
- නාට්‍ය පිටපත අනුව අවශ්‍ය නම් පමණක් සංගීතය යෙදීම
- නාට්‍ය ශෛලිය පිළිබඳ අවධානය යොමු කිරීම
- නාට්‍ය තේමාව පිළිබඳ අවධානය යොමු කිරීම
- නළු නිළියන්ට හැසිරවිය හැකි ගායන පරාසය
- නාට්‍ය අවස්ථා තීව්‍ර කිරීම කෙරෙහි අවධානය යොමු කිරීම
- අධ්‍යක්ෂවරයාගේ උපදෙස් පරිදි සංගීතය නිර්මාණය කිරීම
- නළු නිළි රංගන අබිබවා යාමට නොදීම
- නාට්‍යමය අවස්ථා අතර සම්බන්ධය රැක ගැනීම
- නිර්මාණාත්මක බව, විචිත්‍රත්වය, විවිධත්වය මැවෙන පරිදි යොදා ගැනීම.
- ප්‍රේක්ෂක රස ජනනය වන පරිදි යොදා ගැනීම. (ලකුණු 06 )

04. (I) නරි බෑණා. (ලකුණු 02)

(ii) බක්මහ අකුණු, ගජමන් පුවත, ආනන්ද ජවනිකා, මධුර ජවනිකා, ඉබි කට්ට, කබායේ හබේ, පද්මාවතී, බැංකු නාට්‍ය, ජසයා හා ලෙන්චිනා (ලකුණු 04)

(iii)
- වාර්තා රංගය යොදා ගැනීම. (ආනන්ද ජවනිකා, මධුර ජවනිකා, ගජමන් පුවත)

- කැරකෙන වේදිකාව යොදා ගැනීම. (බක්මහ අකුණු)
- ගැමි නාට්‍ය ආශ්‍රයෙන් නාට්‍ය නිර්මාණය කිරීම.
- පරිවර්තන නාට්‍ය නිර්මාණය කිරීම.
- එපික් රංග ශෛලිය යොදා ගැනීම. (ඉබ් කට්ට) ආදී කරුණු තුනක් විස්තර කොට ඇත්නම් ලකුණු ලබා දෙන්න. (ලකුණු 06 )

05. (I) පූර්ව රංගය/ අපර රංගය (ලකුණු 02)

(ii) අණබෙර කෝලම, නොංචි කෝලම, හේවා කෝලම, පොලිස් කෝලම, ආරච්චි රාල, ජස කෝලම, ලෙන්චිනා කෝලම, මුදලි කෝලම. (ලකුණු 04)

(iii)
- නාට්‍යධර්මී රංග ශෛලිය යොදා ගැනීම
- සබේ විදානේ විසින් සියලු චරිත හඳුන්වා දීම
- වෙස් මුහුණු පැලඳීම
- තානායම් පොළ හෙවත් සබය වේදිකාව ලෙස යොදා ගැනීම
- රැය පහන් වනතුරු රඟ දැක්වීම
- දින තුනත් /හතත් අතර කාලයක් රඟ දැක්වීම
- පූර්ව රංගයක් හා අපර රංගයක් පැවතීම
- පිරිමින් පමණක් රංගනයේ යෙදීම
- පහතරට කවි තාල, බෙර තාල හා නර්තන විලාස යොදා ගැනීම
- හාස්‍යය හා උපහාසය මුල්කොට ගැනීම (ලකුණු 06 )

06. (I) පිටපතකින් තොරව සීමිත කාලයක් තුළ දෙන ලද ඉඟියකට අනුව කිසියම් අවස්ථා නිරූපණයක් කිරීමයි. (ලකුණු 02)

(ii) නාට්‍ය වැඩමුළුවල දී, නළුවරණවල දී, සංවිධානගත නාට්‍ය රංගනයක දී, රංග අභ්‍යාසයක් ලෙස, ආධුනික නළු නිළියන් පුරුදු පුහුණු කිරීමට, රංගන ශිල්පියාගේ නිර්මාණශීලී බව හා පරිකල්පන ශක්තිය මැන බැලීමට, සාමූහික වශයෙන් ඉදිරිපත් කළ හැකි නිසා කණ්ඩායමේ සාමූහිකත්වය වර්ධනය කිරීමට ද මෙය යොදා ගත හැකි ය. (ලකුණු 04)

(iii) පරිකල්පන ශක්තිය දියුණු වීම, නිර්මාණශීලී බව දියුණු වීම, ක්ෂණික තීරණ ගැනීමේ හැකියාව දියුණු වීම, සබකෝලය දුරු වීම, සාමූහිකත්වය ඇති වීම, රංගන කුසලතාව දියුණු වීම ආදී කරුණු තුනක් විස්තර කොට ඇත්නම් ලකුණු ලබා දෙන්න. (ලකුණු 06)

07) ප්‍රශ්නයට අදාළව පසුබිම, කාලය හා චරිත ගොඩනගමින් රංග විධාන හා සංවාද සහිතව චරිත අතර ගැටුමක් මතු වන අයුරින් දෙගිඩියාව, කුතුහලය, උත්ප්‍රාසය සහිතව නාට්‍යෝචිත අවස්ථා ගොඩනගා තිබීම අපේක්ෂා කෙරේ.

ඒ අනුව,

(I) රංග විධාන සහිත සංවාද ගොඩනගා තිබීම (ලකුණු 04)

(ii) චරිත අතර ගැටුමක් ඇතිවන අයුරින් පෙළ සකස් කිරීම (ලකුණු 04)

(iii) දෙගිඩියාව, කුතුහලය, උත්ප්‍රාසය සහිතව නාට්‍යෝචිත අවස්ථා නිර්මාණය කර තිබීම (ලකුණු 04)

ප්‍රශ්න 2 සිට 6 දක්වා පිළිතුරු සැපයීමේ දී iii කොටසට සම්පූර්ණ ලකුණු ලබා දීමට නම් අවම වශයෙන් කරුණු තුනක්වත් විස්තර කිරීම අපේක්ෂා කෙරේ.

*****